# කොවිඩ් 19 සති පාසල සබරගමුව පළාත

# 9 ශ්‍රේණිය - භූගෝලවිද්‍යාව

# ඒකකය 01- ආසියානු ප්‍රදේශය

**ක්‍රියාකාරකම - 08**

**ආර්ථික ක්‍රියාකාරකම් (කර්මාන්ත හා සේවා)**

**හැඳින්වීම**

කෘෂිකර්මාන්තය මෙන්න කර්මාන්ත හා සේවා අංශද ආර්ථික ක්‍රියාකාරකම්වල මූලිකත්වයක් ගනු ලබයි. ආසියාතික බොහෝ රටවල කර්මාන්ත ව්‍යාප්තව පැවතියද ජපානය ඒ අතුරින් වැදගත්වන්නේ ඔවුන්ගේ භාණ්ඩවල පවතින උසස් ප්‍රමිතිය, කල්පැවැත්ම, තාක්ෂණය භාවිතය ආදී ගුණාංගයන් නිසාය. එපමණක්ද නොව ඔවුන්ගේ භාණ්ඩවලට පවතින ලෝක ඉල්ලුමද ඉහල මට්ටමක පවතී. කෘෂිකාර්මික හා කාර්මික අංශ මෙන්න සේවා අංශද ආර්ථික කටයුතු අතර වැදගත් ස්ථානයක් ගනු ලබයි. මිනිස් අවශ්‍යතාවයක් යම් ආයතනයක් මගින් ඉටු කරනු ලබන්නේද එය සේවාවක් ලෙස හැඳින්විය හැකිය. ආසියාතික රාජ්‍යයන් අතර සේවා සපයන වැදගත් රාජ්‍යයක් වශයෙන් ඩුබායි රාජ්‍යය වැදගත් වේ.

**ක්‍රියාකාරකම් සඳහා උපදෙස්**

- භූගෝලවිද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 19 සිට 21 දක්වා හොඳින් කියවා පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නය අභ්‍යාස පොතෙහි සටහන් කරගෙන පිළිතුරු සපයන්න.

**ප්‍රශ්නාවලිය**

1. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව ජපානය ලෝකයේ කීවෙනිතැන ගනීද?
2. එරට දළ ජාතික නිෂ්පාදිතයෙන් කොපමණ ප්‍රමාණයක් කර්මාන්ත අංශය හිමිකරගෙන තිබේද?
3. ජපානයේ නිෂ්පාදන කර්මාන්ත මොනවාද?
4. නිෂ්පාදන කර්මාන්ත අතුරෙන් ජපානයේ ප්‍රධානම කර්මාන්ත ක්ෂේත්‍රය කුමක්ද?
5. ජපානයේ නිෂ්පාදිත මෝටර්රථ සඳහා ඉල්ලුම වැඩිවීමට හේතු මොනවාද?
6. පහත වගුව සම්පූර්ණ කරන්න.

| මෝටර්රථ නිෂ්පාදන සමාගම් | මෝටර් සයිකල් නිෂ්පාදන සමාගම් | ඉලෙක්ට්‍රොනික් හා විදුලිඋපකරණ සමාගම් | පරිසනක හා පරිගනක උපාංග නිෂ්පාදන සමාගම් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7. ජපානය තුළ ජෛව තාක්ෂණය උපයෝගී කරගනු ලබන ක්ෂේත්‍ර මොනවාද?

8. ජපානය ආසියාවේ ප්‍රධාන කාර්මික රටක් ලෙස වැදගත්වීමට හේතු මොනවාද?

9. එක්සත් අරාබි එමීර් රජ්‍යයේ පවතින රාජ්‍යයන් සංඛ්‍යාව කීයද?

10. ඩුබායි ආර්ථිකයේ පදනම කුමක්ද?

11. ඩුබායි ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වැදගත්වීමට හේතු පැහැදිලි කරන්න.

**පසුවැඩ**

ආසියාවේ ආර්ථික ක්‍රියාකාරකම් යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කරන්න.

සැකසුම - කේ. එන්. බී. බී. එම්. ජී. අයි. කේ. නිරිඇල්ල
ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය